# කොස්සින්න යටවත්ත රජමහ විහාරයෙහි ඇති ඉපැරණි විහාර මන්දිරය පිළිබඳව විමර්ශනයක්.

ලක්මාලි ඒ.එස්, ප්‍රියමාලි, ඒ.එස්, මධුෂානි ඊ.පී, චන්ද්‍රසිරි ටී.එම්.ජේ*

කොස්සින්න යටවත්ත රජමහා විහාරයේ ඇති ඉපැරණි විහාර මන්දිරය තුළ ප්‍රධාන හිඳි බුදු පිළිමයක් හා පරිවාර හිටි බුදු රූ දෙකක් දක්නට ලැබේ. බුදු පිළිම පසුපස බිත්ති සිතුවමින් සරසා ඇත. මෙම ප්‍රතිමා හා සිතුවම්වල කලා ලක්ෂණ අනුව ඒවා මහනුවර යුගය නියෝජනය කරන බව නිගමනය කළ හැකි ය. මෙම ඉපැරණි විහාර මන්දිරය පිළිබඳව මෙතෙක් කිසිදු විධිමත් පර්යේෂණයක් සිදුකොට නොමැති අතර 2014 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සිදුකර ඇති ස්ථානීය පර්යේෂණය ද ලේඛනයකට පමණක් සීමාවීම කනගාටුවට කරුණකි. මෙකී විහාර මන්දිරය පිළිබඳව නව තොරතුරු වාර්තාකරමින් ඒ සඳහා විධිමත් පර්යේෂණයක් පැවැත්වීම ද, මෙම සැඟවුණු අතීත උරුමය මතුපරපුර සඳහා ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු කිරීම ද මෙම පර්යේෂණයේ අරමුණ වේ.

ගම්පහ දිස්ත්‍රික්කයේ කොස්සින්න 234, ග්‍රාමනිලධාරී වසමට අයත් මෙම විහාර මන්දිරය දිගින් අඩි 273 ක් හා පළලින් අඩි 14.8 ක් වේ. මෙම විහාර මන්දිරයේ දක්නට ඇති විශේෂ ලක්ෂණ අතර බොරදම් කැටයමින් හා සිතුවමින් අලංකාර වූ රවුම් කුළුණු දෙක සහ මකර තොරණකින් හෝ දොරටුපාල රූප දෙකකින් යුත් ප්‍රවේශ දොරටුව හැඳින්විය හැකිය. කුළුණු මත සතරවරම් දෙවිරූ යැයි සැළකිය හැකි රූ දක්නට ලැබෙන අතර මකර තොරණ මත ද දේවරූප දක්නට ලැබෙන අතර මකර තොරණ මත ද දේවරූප 06 ක් මූර්තිමත් කොට ඇත. දාරුමය දොරටුව ද ලියවැල් මෝස්තරයෙන් අලංකෘත ය. මේ සියල්ල දීර්ඝ කාලීන නඩත්තුවෙන් තොරවීම, මානුෂ ක්‍රියාකාරකම් හා පාරිසරික බලපෑම් හේතුවෙන් විනාශයට පත් ව ඇත. මේ කරුණු සාකච්ඡා කිරීම උදෙසා ක්ෂේත්‍ර සමීක්ෂණ, සම්මුඛ සාකච්ඡා සහ ග්‍රන්ථ පරිශීලනය පර්යේෂණ ක්‍රමවේද ලෙස යොදාගැනේ. දැනට විනාශ වෙමින් පවතන මෙම උරුමය ආරක්ෂා කරගැනීම සඳහා විධිමත් සංරක්ෂණ කටුයතු සිදුකිරීම සහ නිරන්තර අධීක්ෂණය ඒ සඳහා යොමුකරවීම මේ තුළින් අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පද :- ඉපැරණි විහාර මන්දිරය, කොස්සින්න යටවත්ත රජමහ විහාරය.

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. lakmalishashikala7@gmail.com